මගේ අංකය - DNBG/F.15/Pro/2023/2024-11
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය
2023 පෙබරවාරි මස 23 වන දින

<u>පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සුහ සාධක ආපනශාලාව බදු දීම සඳහා මිල ගණන් කැඳවීම</u>

01. පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සුහ සාධක ආපනශාලාව බදුදීම සඳහා මිල ගණන් කැඳවීම සඳහා සීල් තැබූ ලංසුපත් දෙපාර්තමේන්තු මහා පරිමාණ ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ. ලංසු ලියවිලි www.botanicgarden.gov.lk වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් භාගත කර ගත හැක.

02. මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් රු. 10,000/= ක මුදලක් දෙපාර්තමේන්තුව වෙත මුදලින් තැන්පත් කිරීමෙන් ලබාගත් පොදු 172 ලදුපතේ පිටපත් හෝ පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් රු. 20,000/=ක වටිනාකමින් යුත් දින 90 ක් දක්වා වලංගු කොන්දේසි විරහිත බැංකු ඇප බැඳුම්කරයක්ලංසු සුරක්ෂණ පත්‍රයක් ලංසුපත් සමඟ අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැති ලංසුපත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු සුරක්ෂණය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව නමින් ලබාගත යුතු අතර එය ලංසු විවෘත කරන දින සිට දින 90ට වලංගු විය යුතුය.

03. අදාල පිරිවිතර වලින් යුත් ඔබගේ ලංසු පත් 2023.03.15 වැනි දින පෙ.ව.11.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් පහත ලිපිනයට යොමු කරන්න. (ලංසුපත් 2023.03.15 දින පෙ.ව.11.00 විවෘත කරනු ලැබේ.)

සභාපති,
මහා පරිමාණ ප්‍රසම්පාදන මණ්ඩලය,
ජාතික උද්භිද උද්‍යානය දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 14,
පේරාදෙණිය.

04. ලංසුපත් මෙම දෙපාර්තමේන්තු කාර්යාලයේ ප්‍රධාන ගණකාධිකාරි කාමරයේ තබා ඇති ලංසුපත් බහාලන පෙට්ටිය වෙත අතින් ගෙනවිත් බහාලීමටද පහසුකම් සලසා ඇත. සෑම ලංසුපතක්ම බහාලන කවරයේ වම්පස ඉහල කෙලවර "DNBG/F.15/Pro/2023/2024-11 පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානයේ සුහ සාධක ආපනශාලාව බදු දීම " යනුවෙන් සඳහන් කරන්න. ලංසුපත් ඉහත දින නියමිත වේලාවට විවෘත කරන අතර, එම අවස්ථාවට ඔබට හෝ ඔබ විසින් නම් කරනු ලබන නියෝජිතයෙකුට හෝ සහභාගී විය හැක. ඉදිරිපත් කරනු ලබන ලංසු පත් සම්පූර්ණයෙන්ම හෝ ඉන් අඩක් හෝ පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය ප්‍රසම්පාදන මණ්ඩලයේ සභාපති සතුවන බවද සළකන්න. මේ සම්බන්ධයෙන් වැඩිමනක් තොරතුරු අවශ්‍ය වන්නේ නම් අංක 0812388654 අංකයෙන් ප්‍රධාන ගණකාධිකාරි ඇමතීමෙන් ලබාගත හැකිය.

වී.ජී.සී.නදීශා ගමගේ
ප්‍රධාන ගණකාධිකාරි
ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව